සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

8712

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2019**
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම :-........................................ විභාග අංකය:-........................................

සැලකිය යුතුයි.
- I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාරදෙන්න.

## I කොටස

- **ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පහත සඳහන් පොදු සේවා අතරින් බ්‍රිතාන්‍ය යුගයේ ආරම්භ කරන ලද පොදු සේවාව කුමක් ද?
    (1) අධ්‍යාපනය. (2) සෞඛ්‍යය.
    (3) තැපැල් හා විදුලි පණිවුඩසේවා. (4) විදුලිය.

02. නිදහස් අධ්‍යාපනය පොදු සේවාවක් ලෙස ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමේ ගෞරවය හිමිවන්නේ,
    (1) ඊ. ඩබ්. අධිකාරම් මැතිතුමාට ය. (2) සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමාට ය.
    (3) ආචාර්ය සේනක බිබිලේ මැතිතුමාට ය. (4) ඩී. එස්. සේනානායක මැතිතුමාට ය.

03. ඔබ ප්‍රදේශයේ නීතිය හා සාමය සුරකීම හා මහජන ආරක්ෂාව සැපයීමේ ප්‍රධාන වගකීම ඉටුකරන ආයතනය වන්නේ,
    (1) ශ්‍රී ලංකා යුධ හමුදාව ය. (2) සිවිල් ආරක්ෂක බලකාය ය.
    (3) ශ්‍රී ලංකා ගුවන් හමුදාව ය. (4) ශ්‍රී ලංකා පොලිසිය ය.

04. ලොව දක්නට ලැබෙන බහු සංස්කෘතික සමාජ පවතින රටවල් අතරින් ප්‍රබලතම බහු සංස්කෘතික ලක්ෂණ දකගත හැකි රට කුමක් ද?
    (1) බ්‍රිතාන්‍යය. (2) ඉන්දියාව. (3) පාකිස්ථානය. (4) ශ්‍රී ලංකාව.

05. රිය අනතුරු සිදුවීමට බලපාන ප්‍රධාන හේතුව සහිත පිළිතුර කුමක් ද?
    (1) මිනිසාගේ මැදිහත් වීමෙන් සිදුවන වැරදි. (2) මාර්ගවල තිබෙන අඩුපාඩු.
    (3) වාහනවල යාන්ත්‍රික දෝෂ. (4) ස්වාභාවික සිදුවීම්.

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**
  **(සංරක්ෂක, සේවා ලාභියා, ශ්‍රමාභිමානය, චිත්තවේග, අනන්‍යතාව, සේවා දායකයා, ආරක්ෂක)**

06. පුද්ගලයා සිදුකරන කාර්යය සතුටින් හා කැමැත්තකින් යුතුව ඉටුකිරීම ........................................ නම් වේ.

07. නියඟයෙන් ආරක්ෂා වීමට වන ආවරණ ඉවත් නොකිරීම, ගස්වැල් සිටුවීම හා වන වගාව වැනි ජල ........................................ ක්‍රම භාවිතය වැදගත් වේ.

08. එක් සංස්කෘතියක් තවත් සංස්කෘතියකින් වෙන් කර හඳුනාගත හැකි වන්නේ සංස්කෘතික ....................... තුළිනි.

09. අයහපත් .......................................... තත්වයන් දිගින් දිගටම පැවැතීම නිසා පුද්ගලයා කායික, මානසික හා සමාජීය වශයෙන් පිරිහීමට ලක්වේ.

10. කිසියම් ආයතනයකින් සේවා ලබාගන්නා පුද්ගලයා........................................ ලෙස හැඳින්වේ.

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රකාශ හරිනම් ( ✔ ) ලකුණ ද, වැරදි නම් ( ✕ ) වැරදි ලකුණ ද, වරහන තුළ යොදන්න.

11. ශ්‍රමයේ ඵලදායිතාව ඇතිවන්නේ ශ්‍රමිකයාගේ දැනුම, ආකල්ප හා කුසලතා මට්ටම් අනුව ය. (..............)

12. පොදුසේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියකු වශයෙන් ඒවා අනිසි ලෙස පරිහරණය කළ යුතුය. (..............)

13. ප්‍රජාතන්ත්‍රවාදී දිවිපැවැත්ම යනු ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග තම ජීවන පුරුදු බවට පත්කරගෙන යහපත් පුද්ගලයකු ලෙස ජීවත් වීමය. (..............)

14. ආපදා මගින් සිදුවන හානි අවම කරගැනීමේ ක්‍රියාවලිය ආපදා කළමණාකරණය ලෙස හැඳින්වේ. (..............)

15. පොදු දේපල අයුතු ලෙස පරිහරණය කිරීම ඒකාධිපති නායකත්ව ශෛලියේ ලක්ෂණයකි. (..............)

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා X කොටසේ ප්‍රකාශයට වඩාත් නිවැරදි පිළිතුර Y කොටසින් තෝරා අදාළ අක්ෂරය වරහන් තුළ යොදන්න.

X කොටස

16. එකාසැමටත් සැම එකාටත් (...........)

17. තෛපොංගල් උත්සවය හා මහාශිව රාත්‍රී උත්සවය (...........)

18. නියමිත මාත්‍රාව භාවිතා කිරීම, නියමිත වේලාවට ඖෂධ භාවිත කිරීම. (...........)

19. ජීවිත ඉලක්ක ජයගැනීමේ දී ඇතිවන බාධා (...........)

20. අනාගත පරපුරේ අවශ්‍යතා ඉටුකර ගැනීමට බාධා නොවන අයුරින් වත්මන් පරපුරේ අවශ්‍යතා ඉටුකර ගැනීම. (...........)

Y කොටස

A. ඖෂධ භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු වේ.

B. ඉස්ලාමීය සංස්කෘතික උත්සව වේ.

C. ජීවිත අභියෝග වේ.

D. සමූපකාර ව්‍යාපාරයේ ආදර්ශ පාඨය වේ.

E. හින්දු ආගමික, සංස්කෘතික උත්සව වේ.

F. තිරසර සංවර්ධනය වේ.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01. (i) රජය මගින් සැපයෙන පොදු සේවා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකවන සමුපකාර සමිති වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) ළමා අයිතිවාසිකම් වෙන්කර ඇති තේමා හතරෙන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iv) පුද්ගලයකු තුළ හටගන්නා චිත්තවේග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(v) ඉස්ලාමීය ආගමික උත්සවයක් හා ක්‍රිස්තියානි/ කතෝලික ආගමික උත්සවයක් ලියා දක්වන්න. (ලකුණු 02)

(vi) ගංවතුර ඇතිවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(vii) අනතුරු හා ආපදාවල දී සහාය ලබාගත හැකි ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(viii) වෘත්තීය පුහුණුව ලබාදෙන ආයතන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

02. (i) සමාජයේ පවතින සියලු ම රැකියා අවස්ථා වැඩලෝකය ලෙස හැඳින්වේ. ඒ අනුව,

A. කාර්මික අංශයේ රැකියාවක් ද,

B. සේවා අංශයේ රැකියාවක් ද ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) ශ්‍රමිකයකු තුළ තිබිය යුතු යහපත් ගුණාංග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) සේවකයකු විසින් ලබාගත යුතු අයිතිවාසිකම් තුනක් හා ඉටුකළ යුතු යුතුකම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 05)

03. (i) ළමා අයිතිවාසිකම් අරක්ෂා කරදීමට ක්‍රියාත්මක වන ආයතන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) අයහපත් චිත්තවේග සමනය කරගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හතරක් පහත A, B, C, D රූප සටහන්වල දක්වේ. එම අවස්ථා හතර හඳුනා ගෙන නම් කරන්න. (ලකුණු 04)

A


B


C


D


(iii) ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු සතුවිය යුතු ගුණාංග තුනක් සඳහන් කර ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට යහපැවැත්මට එම එක් ගුණාංගයක් හේතුවන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04. (i) බහු සංස්කෘතික ජන සමාජයක් පවතින ශ්‍රී ලංකාවේ විවිධ ආගම් අදහන ජන කොටස් ජීවත් වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ පවතින ආගම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) බහු සංස්කෘතික ජන සමාජයක් පවතින රටක පුරවැසියන් ප්‍රගුණ කළ යුතු ගුණාංග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ජාතික සමගිය හා තිරසර සාමය ගොඩනගා ගැනීමේ වාසි පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

05. (i) පහත දක්වෙන්නේ වර්තමානයේ මුහුණ පෑමට සිදුවන අනතුරු හා විපත් ලේඛනයකි. ඒ අතර

A. ස්වාභාවික විපතක් ද

B. මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන විපතක් ද සඳහන් කරන්න. (ලකුණු 02)

- නියඟ
- ලැව්ගිනි
- ඩෙංගු උවදුර
- රිය අනතුරු
- රසායනික අනිසි භාවිතය (වකුගඩු ආබාධ)

(ii) ඉහත සඳහන් විපත් හා අනතුරු ඇතිවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් දෙක බැගින් ලියා දක්වන්න.

A. ආහාර විෂවීම.

B. සුනාමි (ලකුණු 04)

(iii) තිරසර සංවර්ධනයේ දී අප සියලු දෙනා සැලකිලිමත් විය යුතු කරුණු තුනක් සඳහන් කර ඉන් එක් කරුණක් තිරසර සංවර්ධනයට දායක කර ගන්නා ආකාරය විස්තර කරන්න.

(ලකුණු 05)

06. (i) පාසල් සිසුවකු/සිසුවියක වශයෙන් ඔබ මුහුණ දෙන ගැටලු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ජීවිත අභියෝග ජය ගැනීමට ඔබ විසින් ප්‍රගුණ කළයුතු ගුණාංග හතරක් සඳහන් කරන්න.

(ලකුණු 04)

(iii) පහත දක්වෙන ජීවිත අභියෝග ජයගැනීම සඳහා ගතහැකි ක්‍රියා මාර්ග එක බැගින් ලියා දක්වන්න.

A. විභාගවලින් ජයගැනීම.

B. ජීවිත ඉලක්ක ජයගැනීම.

C. බාධක ජයගැනීම.

D. චිත්ත ධෛර්යය වර්ධනය කර ගැනීම.

E. නව නිර්මාණ බිහිකිරීම. (ලකුණු 05)

07. (i) පණිවිඩ හුවමාරු සේවා වර්තමානයේ අත්‍යවශ්‍ය සේවා බවට පත්වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පොදු සේවාවල පොදු ලක්ෂණ හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) පහත සඳහන් පොදු සේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියන් විසින් ඉටු කළයුතු යුතුකම් පහක් ලියා දක්වන්න.

A. විදුලිය.

B. ජලය.

C. පරිසර සංරක්ෂණය.

D. සෞඛ්‍යය.

E. සමූපකාර සේවාව. (ලකුණු 05)